ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

60 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2015 ජූලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2015

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
**Business and Accounting Studies I, II**

පැය තුනයි
*Three hours*

10 ශ්‍රේණිය
*Grade 10*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුය :
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය මත (x) ලකුණ යොදන්න.
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැළකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

01. I තීරුවේ අවශ්‍යතා හා II තීරුවේ වුවමනා කිහිපයක් දැක්වේ. මින් නිවරදිව ගලපා ඇති පිළිතුර වන්නේ,

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. ආහාර | A මහල් නිවාස |
| 2. නිවාස | B සරම |
| 3. ඇඳුම් | C පරිගණක |
| 4. අධ්‍යාපනය | D කිරි |

1. *ADBC* 2. *DACB* 3. *DABC* 4. *BADC*

02. මිනිස් වුවමනා පමණක් ඇතුලත් කාණ්ඩය වන්නේ,
1. ආහාර, ඇඳුම්, සන්නිවේදනය
2. නිවාස, මෝටර් රථ, ආහාර
3. අධ්‍යාපනය, විනෝදය, ආරක්ෂාව
4. සිසිල් බීම, පාවාහන්, මහල් නිවාස.

03. විවිධ ව්‍යාපාර වලින් අද බහුලව දැකිය හැක්කේ,
1. භාණ්ඩ නිෂ්පාදනය කිරීමය.
2. මිනිස් අවශ්‍යතා සපුරාලීමයි.
3. භාණ්ඩ බෙදාහරීම
4. මිනිස් වුවමනාවන් නිර්මාණය කිරීමය.

04. මිනිස් අවශ්‍යතා සපුරාගැනීමට යොදා ගන්නා විවිධ ස්වරූප වුවමනා ලෙස හඳුන්වයි. මෙහි සඳහන් වන මූලික අවශ්‍යතාවයන් වන්නේ,
1. ආහාර, ඇඳුම් පැළඳුම්, නිවාස, අධ්‍යාපනය, සෞඛ්‍යය, ආරක්ෂාව
2. ආහාර, ධාන්‍ය ආහාර, ශාක ආහාර, මාංශ ආහාර, මත්ස්‍ය ආහාර
3. නිවාස, අන්තර් ජාලය, ගුරුවරු, පාසල්, පොත්පත්
4. ආරක්ෂාව, ආහාර, නිවාස, වෛද්‍යවරු, රක්ෂණාව, රැකියාව.

05. අවශ්‍යතාවක ලක්ෂණයක් නොවන්නේ,
1. අත්‍යවශ්‍ය වීම
2. නිර්මාණය කළ නොහැකි වීම
3. අසීමිත වීම
4. පොදු වීම.

06. කය වෙහෙසා වැඩ කරන පුද්ගලයකි.
1. ගණකාධිකාරිවරු 2. පතල් සේවකයන් 3. වෛද්‍යවරු 4. කළමණාකරුවන්

07. "ව්‍යාපාර වලින් තොර සමාජයේ පැවැත්මක් නැත." එයට හේතුව ලෙස දැකිය හැක්කේ,
1. ව්‍යාපාර සමාජයේ බහුලව ඇති නිසා ය.
2. ව්‍යාපාර සීඝ්‍ර ලෙස වර්ධනය වි ඇති නිසා ය.
3. ව්‍යාපාර සමාජයේ අවශ්‍යතාවයක් බවට පත් වී ඇති නිසා ය.
4. ව්‍යාපාර වලින් සියලුම මිනිස් අවශ්‍යතා සපුරාලන නිසා ය.

08. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය යනු ව්‍යාපාරයට සමීප පරිසරයයි. අභ්‍යන්තර පරිසර සාධක ව්‍යාපාරයට සෘජු බලපෑම් ඇති කිරීමට සමත් වේ. මෙහි සඳහන් වන අභ්‍යන්තර පරිසර සාධකයකි.
   1. අන්තර් ජාතික සම්බන්ධතා   2. ගනුදෙනුකරුවෝ
   3. උද්ධමන අනුපාතය   4. සේවකයෝ

09. රජය ව්‍යාපාර කෙරෙහි එතරම් ඇල්මක් නොදක්වන්නේ මින් කුමකට ද?
   1. ලැබිය යුතු බදු නිසි ලෙස ලබා ගැනීමට
   2. රැකියා උත්පාදනය කර දීමට
   3. ජාතික නිෂ්පාදිතය වර්ධනය කර ගැනීමට
   4. පරිසරයට හිතකර ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යන්නේ දැයි විමසා බැලීමට.

10. ව්‍යාපාරයකට ඇති තර්ජනයකි,
   1. නව නගර නිර්මාණය.   2. අධිවේගී මාර්ග ඉදිකිරීම
   3. ජාත්‍යන්තර වෙළෙඳ සම්බාධක පැනවීම   4. ව්‍යාපාර සඳහා බදු සහන ලබා දීම

11. දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑමක් වන්නේ,
   1. නවීන තාක්ෂණය ලබා ගතහැකි වීම.   2. දැඩි තරගකාරීත්වයකට මුහුණ දීමට සිදුවීම
   3. දේශිය පුහුණු ශ්‍රමය විදේශිය රටවලට ඇදී යාම.   4. දේශීය සංස්කෘතියේ අයහපත් වෙනස්කම් ඇති වීම.

12. ව්‍යාපාර සංවිධාන වර්ග කරන පදනමක් නොවන්නේ,
   1. සංවිධාන ස්වරූපය අනුව   2. හිමිකාරීත්වය අනුව
   3. පරිමාණය අනුව   4. අරමුණ අනුව

13. 2007 අංක 7 දරණ සමාගම් පණත අනුව සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා අයදුම් කිරීමේදී සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු ප්‍රධාන ලියවිල්ල,
   1. සංස්ථාපන සහතිකයයි.   2. සංගාමික සංස්ථා පත්‍රයයි.
   3. සංස්ථා ප්‍රකාශයයි.   4. සාංගමික ව්‍යවස්ථාවලියයි.

14. හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කළ යුත්තේ,
   1. ග්‍රාම නිළධාරී වෙතින්   2. ප්‍රාදේශීය ලේකම් වෙතින්.
   3. සමාගම් රෙජිස්ට්‍රාර් වෙතින්   4. සමුපාකාර සංවර්ධන කොමසාරිස් වෙතින්.

15. ගණකාධිකාරීවරුන්, නීතිඥයන්, වෛද්‍යවරු වැනි වෘත්තීන් වල යෙදී සිටින අයට බෝහෝ විට ආරම්භ කළ හැකි වඩාත් සුදුසු ව්‍යාපාර සංවිධානය කුමක් ද?
   1. තනි ව්‍යාපාර   2. හවුල් ව්‍යාපාර   3. සීමිත සමාගගම්   4. රාජ්‍ය සංස්ථා

16. රු. 1,000 කට වැඩි ප්‍රාග්ධනයක් යොදා හවුල් ව්‍යාපාරයක් ඇරඹීමේදී ලිඛිත ගිවිසුමක් මත ආරම්භ කළ යුතු බව කියවෙන පණත කුමක් ද?
   1. 1890 හවුල් ආඥා පණත   2. 1840 වංචා වැළැක්වීමේ ආඥා පණත
   3. 2007 අංක 7 දරණ සමාගම් පණත   4. 1972 අංක 5 දරණ සමුපාකාර පණත

17. රාජ්‍ය සංස්ථාවක් නොවන්නේ,
   1. ශ්‍රී ලංකා වරාය අධිකාරිය   2. කෘෂි රක්ෂණ මණ්ඩලය
   3. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව.   4. ශ්‍රී ලංකා තැපල් දෙපාර්තමේන්තුව

18. රාජ්‍ය සංස්ථා ඇරඹිය හැක්කේ,
   1. සමාගම් පණත මගින්   2. සංස්ථාව භාර ඇමතිවරයා මගින්.
   3. විශේෂ හෝ පොදු පාර්ලිමේන්තු පණතක් මගින්   4. පොදු පණතක් මගින්.

19. නීතිමය කටයුතු වලදී සිය නිල නාමයෙන් පෙනී සිටිය යුත් ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,
   1. රාජ්‍ය සංස්ථා   2. සමුපාකාර සමිති   3. සංස්ථාපිත සමාගම්   4.. රාජ්‍ය දෙපාර්තමේන්තු

20. කළමණාකරණ මූලිකාංග ඇතුලත් කාණ්ඩය තෝරන්න.
   1. සැලසුම්කිරීම, සංවිධානය, මග පෙන්වීම, පාලනය.
   2. අරමුණ පිහිටුවීම, තීරණ ගැනීම, සංවිධානය, මග පෙන්වීම.

21. වගකීමක ලක්ෂණයක් නොවන්නේ,
   1. අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් වීම
   2. ව්‍යාපාරයේ පාලනයට යටත් වීම.
   3. බේරුම් කිරීමේ දී ව්‍යාපාරයේ සම්පත් ඉවතට ගලා යාම
   4. වර්තමාන බැදීමක් තිබීම.

22. ව්‍යාපාරයක අයිතිකරුවන් වෙනුවෙන් පවතින වත්කම් ප්‍රමාණය.
   1. වගකීම් වේ. 2. හිමිකම් වේ. 3. ආදායම් වේ. 4. වියදම් වේ.

23. ගිණුම්කරණයේ මූලික අරමුණ වනුයේ,
   1. සියළුම ගනුදෙනු පොත්පත් වල සටහන් කිරීම
   2. මූල්‍ය ගනුදෙනු වර්ග කිරීම, වාර්තා කිරීම.
   3. තොරතුරු භාවිතා කරන ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශවයන්ට තොරතුරු සැපයීම.
   4. ආයතනයේ මූල්‍ය තත්වය දැක්වීම.

24. නිවැරදි ගිණුම්කරණ සමීකරණය වනුයේ,
   1. වගකීම් = ප්‍රාග්ධනය + වත්කම් 2. හිමිකම් = වත්කම් + වගකීම්
   3. ප්‍රාග්ධනය = වත්කම් - වගකීම් 4. වත්කම් = ප්‍රාග්ධනය - වගකීම්

25. වත්කම් වල ස්වභාවය මත වර්ග කෙරෙන ප්‍රධාන වත්කම් වනුයේ,
   1. ජංගම වත්කම් හා කෙටිකාලීන වත්කම් 2. ජංගම නොවන වත්කම් හා කෙටිකාලීන වත්කම්
   3. ජංගම වත්කම් හා ජංගම නොවන වත්කම් 4. ජංගම නොවන වත්කම් හා ස්ථාවර වත්කම්

26. අයිතිකරුගේ හිමිකම් අඩු වනුයේ,
   1. ණයට භාණ්ඩ ගැනීම රු. 12,000 යි
   2. යන්ත්‍රයක් වික්කා රු. 25,000 යි
   3. අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම රු. 3,000 යි
   4. බැංකු ණය ගෙව්වා රු. 10,000 යි.

27. ජංගම වත්කම් පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
   1. බඩුතොගය, ණයගැතියෝ, කලින් ගෙවූ රක්ෂණය 2. උපචිත වියදම්, ණයගැතියෝ, ලී බඩු
   3. ණයගැතියෝ, බැංකු ණය, මුදල් 4. යන්ත්‍ර, ලිපිද්‍රව්‍ය, ණයගැතියෝ.

28. මුදල් ලැබීම හා වෙළෙඳ භාණ්ඩ ණයට විකුණුම් සටහන් කරන උපයෝගී පොත් වන්නේ,
   1. බැංකු ගිණුම හා විකුණුම් ජ'නලය 2. ගැණුම් ජ'නලය හා මුදල් පොත
   3. මුදල් පොත හා විකුණුම් ජ'නලය 4. මුදල් පොත හා පොදු ජ'නලය

29. ව්‍යාපාරයකට ප්‍රාග්ධනය යෙදවීම මගින්,
   1. මුදල් වැඩිවේ, හිමිකම් වැඩි වේ. 2. වගකීම් වැඩිවේ, මුදල් වැඩි වේ.
   3. ආදායම් වැඩි වේ, මුදල් අඩු වේ. 4. වත්කම් වැඩි වේ, මුදල් වැඩි වේ.

30. ගිණුම්කරණයේ දී ද්විත්ව සටහන් ක්‍රමය පිළිබඳ නිවැරදි ප්‍රකාශය පහත සඳහන් වගන්ති වලින් තෝරන්න.
   1. ගනුදෙනුවක අදාල වටිනාකම ගිණුම් දෙකක සටහන් කිරීම ය.
   2. වත්කම් හර කර වගකීම් බැරට සටහන් කිරීම යි.
   3. ගනුදෙනුවක අවසාන ප්‍රතිඵල දෙවරක් සටහන් කිරීම යි.
   4. ගනුදෙනුවක ඇති ද්විත්ව ප්‍රතිඵලය අදාල ගිණුම් වල හර හා බැර ලෙස සටහන් කිරීම යි.

31. සුළු මුදල් අග්‍රිමය ලැබෙන ද්විත්ව සටහන වනුයේ,
   1. මුදල් පොත හර - සුළු මුදල් පොත බැර
   2. අදාල වියදම් ගිණුම හර - සුළු මුදල් පොත බැර
   3. සුළු මුදල් පොත හර - මුදල් පොත බැර
   4. සුළු මුදල් පොත හර - අදාල වියදම් ගිණුම හර

32. එක්තරා ව්‍යාපාරයක සුළු මුදල් අග්‍රිමය රු. 5,000 කි. සුළු මුදල් භාරකරු මාසය තුළ රු. 4,500 ක් වියදම් කර ඇත. මාසය අවසානයේ සුළු මුදල් භාරකරු සතුව රු. 500 ක ඉතිරියක් ඇත. අග්‍රිමය ප්‍රතිපූරණය කිරීමට සුළු මුදල් භාරකරු වෙත ලැබිය යුතු මුදල කියද?
   1. රු. 500 2. රු. 5,000 3. රු. 7,500 4. රු. 4,500

33. මුදල් පොතේ ගනුදෙනු සටහන් කරන මුලාශ්‍ර ලේඛණයක් වන්නේ,
   1. හර පත 2. ලදු පත 3. බැර පත 4. ඉන්වොයිසිය.

34. සී/ස මොනිකා සමාගමෙන් මොරිස් භාණ්ඩ මිලට ගැනි. ඔහුට මිල දර්ශනයේ සඳහන් මිලෙන් 25% වෙළෙඳ වට්ටමක් ද මාසයක් ඇතුළත ගෙවීම් සිදුකළහොත් අමතරව 5% මුදල් වට්ටමක් දෙනු ලැබේ. 2015 ජුනි මාසයේ මිල දර්ශනයේ සඳහන් රු. 800,000 ක භාණ්ඩ මොරිස් මිලට ගත්තේ ය. මාසයක් ඇතුළත ඔහු තම මුදල් ගෙවීම් සිදුකර දමන ලදි. මොරිස් විසින් ගෙවිය යුතු මුළු මුදල කියද ?
   1. රු. 600,000 2. රු. 570,000 3. රු. 770,000 4. රු. 560,000

35. උපයෝගි පොත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොවන්නේ,
   1. ගිණුම්කරණ දෝෂ අඩුවීම හා සිදුවන දෝෂ හඳුනා ගැනීම පහසු වීම.
   2. වැරදි වංචා අවම කර ගත හැකි වීම.
   3. ලෙජරය පවත්වාගෙන යාම අපහසු වීම.
   4. එකම වර්ගයේ ගනුදෙනු වර්ග කර සටහන් කිරීමට අවශ්‍ය වීම.

36. දුන් වට්ටම් වලට අදාල නිවැරදි ද්විත්ව සටහන වනුයේ,
   1. ණයහිමි ගිණුම හර, දුන්වට්ටම් ගිණුම බැර 2. දුන්වට්ටම් ගිණුම හර, ණයගැති ගිණුම බැර
   3. දුන්වට්ටම් ගිණුම් බැර, ණයගැති ගිණුම හර 4. විකුණුම් ගිණුම හර, දුන්වට්ම් ගිණුම බැර

37. ප්‍රධාන වට්ටම් වර්ග දෙක වනුයේ,
   1. වෙළෙඳ වට්ටම්, දුන් වට්ටම් 2. වෙළෙඳ වට්ටම්, මුදල් වට්ටම්
   3. දුන් වට්ටම්, ලද වට්ටම් 4. මුදල් වට්ටම්, දුන් වට්ටම්

38. රු. 50,000ක බැංකු ණයක් ලබා ගැනීමේ ද්විත්ව සටහන වනුයේ,
   1. මුදල් ගිණුම හර රු. 50,000
      බැංකු ණය ගිණුම බැර රු. 50,000
   2. බැංකු ණය ගිණුම හර රු. 50,000
      මුදල් ගිණුම බැර රු. 50,000
   3. ප්‍රාග්ධන ගිණුම හර රු. 50,000
      මුදල් ගිණුම බැර රු. 50,000
   4. මුදල් ගිණුම හර රු. 50,000
      බැංකු ගිණුම බැර රු. 50,000

39. වෙළෙඳ වට්ටමක් යනු,
   1. ණයගැතියන්ගෙන් මුදල් ලැබීමේ දි ලැබිය යුතු ණය වටිනාකමෙන් කෙරෙන අඩු කිරීම යි.
   2. ණයහිමියන්ට මුදල් ගෙවීමේ දි ගෙවිය යුතු වටිනාකමෙන් ණයහිමියන් අඩු කරන ප්‍රමාණය.
   3. අදාළ කාලය තුළ මුදල් ගෙවීම තුළින් ණය ගැතියන්ගෙන් අඩු කරන මුදල් ප්‍රමාණය.
   4. භාණ්ඩයක ලකුණු කළ මිලෙන් කිසියම් ප්‍රමාණයක් අඩු කර විකිණීම.

40. නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   1. ණයහිමියන්ට ගෙවිය යුතු මුදලින් කරනු ලබන අඩු කිරීම් ලද වට්ටම් වේ.
   2. වෙළෙඳ වට්ටම් ගිණුම්ගත කරයි.
   3. දුන් වට්ටම් ණයගැති ගිණුමට හර කරයි.
   4. ලද වට්ටම් වියදමක් වන අතර දුන් වට්ටම් ආදායමකි.

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර විසින් සම්පාදිත යි.